**මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2015**

Primary Piriven Mid Year Term Test - 2015

1 වසර / Grade 1

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**ත්‍රිපිටක ධර්මය**
**Tripitaka Dharmaya**

කාලය : පැය දෙකයි
Time : Two hours

❖ **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

**01. A කොටසේ වැකිවලට ගැළපෙන පිළිතුර B කොටසින් තෝරා යාකරන්න.**

| A | B |
|---|---|
| 1. සිව්වනක් පිරිසට අයත් වේ. | 1. පන්සිල් |
| 2. සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි | 2. දසධම්ම සූත්‍රය |
| 3. පූර්වාරාමය | 3. තෙරුවන් |
| 4. පණිවායෙන් දුරුවීම | 4. චීවර |
| 5. මොනෙය්‍ය ප්‍රතිපදාව | 5. උපාසක |
| 6. පුෂ්පක ගිරා පැටියා | 6. විශාඛා උපාසිකාව |
| 7. අභික්ඛණං මේ ආකප්පො.... | 7. දිව්‍ය ලෝකය |
| 8. බුද්ධ ධම්ම සංඝ | 8. සිවුරු |
| 9. හෙරණ සිඛ | 9. කිසිවකු සමඟ කථා නොකිරීම |
| 10. තුසිතය | 10. සත්ති ගුම්බ ජාතකය |

(ලකුණු 20)

**02. හිස්තැන් පුරවන්න.**

ඒ මොහොතේ ම ''යසෝදරාව පුතකු බිහිකළා යයි ........................................ රජතුමාගෙන් පණිවිඩයක් ලැබිණි. ඒ ඇසූ බෝසත් ........................................ රජුට එක වර ම ''රාහුලයෙක් උපන්නා බන්ධනයක් ඇතිවුණා.'' යයි කියවිණි. කුළුඳුල් පුතකු ලැබීම ප්‍රීතිය උපදවන්නකි. එහෙත් ජීවිතය පිළිබඳ කලකිරීමෙන් පසු වූ .................................. රජුට එය දැනුණේ බන්ධනයක් ලෙසිනි. .................................. පෙරළා ගොස් සිදුහත් රජතුමා කී වදන් සුදොවුන් රජතුමාට දැන්වී ය. ඒ ඇසූ මහරජතුමා තම මුනුබුරු කුමරුට .................................. යයි නම් තැබී ය.

(ලකුණු 10)

**03. දී ඇති පාඨ යොදා දස සිල්වල හිස්තැන් පිළිවෙළින් පුරවන්න.**

**අබ්‍රහ්මචරියා, නච්ච ගීත වාදිත විසූකදස්සනා, ජාතරූප රජත පටිග්ගහණා, පාණාතිපාතා, විකාල භෝජනා**

1. ............................................................... වේරමණී සික්ඛාපදං සමාදියාමි.

2. අදින්නාදානා වේරමණී සික්ඛා පදං සමාදියාමි.

3. ............................................................... වේරමණී සික්ඛාපදං සමාදියාමි.

4. මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

5. සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

6. ....................................................................... සික්ඛාපදං සමාදියාමි.

7. ...............................................................වේරමණී සික්ඛාපදං සමාදියාමි.

8. මාලා ගන්ධ විලේපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

9. උච්චාසයන මහාසයනා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

10. ................................................................ වේරමණී සික්ඛාපදං සමාදියාමි.

(ලකුණු 10)

**04. පහත සඳහන් ගාථා සම්පූර්ණ කරන්න.**

i. නිබ්බුතා නූන සා මාතා...........

ii. දුල්ලභඤ්ච මනුස්සත්තං ......... (ලකුණු 10)

**05. පහත සඳහන් හිස්තැන් පුරවා සංඝරත්නය වඳින පාඨය සම්පූර්ණ කරන්න.**

**ඤායපටිපන්නො, උජුපටිපන්නො, ආහුණෙය්‍යො, අඤ්ජලීකරණීයො, දක්ඛිණෙය්‍යො**

සුපටිපන්නො භගවතෝ සාවක සංඝෝ
....................................... භගවතෝ සාවක සංඝෝ
......................................... භගවතෝ සාවක සංඝෝ
සාමීචිපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ
යදිදං චත්තාරි පුරිස යුගානි අට්ඨ පුරිස පුග්ගලා එස භගවතෝ සාවක සංඝෝ
.......................................................... පාහුණෙය්‍යො ......................................
................................................... අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්සාති..

(ලකුණු 10)

**06. පස්මහ බැලුම් නම් කරන්න.**

.......................................................................................................................

.......................................................................................................................

(ලකුණු 05)

**07. පහත සඳහන් වැකි නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන් තුළ යොදන්න.**

i. සුද්ධෝදන රජතුමා සිදුහත් කුමරු සක්විති රජු වනු දැකීමට කැමති විය. ( )

ii. සිදුහත් කුමරු ශිල්ප නූගත් අයෙකු ලෙස ඥාතීන් ප්‍රකාශ කළේ ඔවුන් කුමරු ශිල්ප ඉගෙන ගත් අයුරු නොදුටු නිසා ය. ( )

iii. වප් මඟුල් දින සුද්ධෝදන රජු සිදුහත් කුමරුට වැන්දේ දෙවන වතාවට ය. ( )

iv. බමුණන් විසින් සිදුහත් කුමරු සක්විති රජු හෝ බුදුවන බව ප්‍රකාශ කළේ මහා පුරුෂ ලක්ෂණ දැකීමෙනි. ( )

v. බෝසත් කුමරු පෝෂණය කිරීමට පත් කර ගත් කිරිමවුවරු ක්ෂත්‍රිය වංශයට අයත් වූවෝ ය. ( )

vi. නිබ්බුත පද ප්‍රකාශ කළේ කිසාගෝතමිය විසිනි. ( )

vii. සිදුහත් බෝසතාණෝ ඉපදුණේ ඇසළ පොහෝ දිනක දී ය. ( )

viii. සිදුහත් කුමරු ශිල්ප ඉගෙන ගත්තේ අසිත තවුසා ගෙනි. ( )

ix. සිදුහත් කුමරු ඒකාන්තයෙන් බුදුවන බව ප්‍රකාශ කළේ අසිත තවුසා ය. ( )

x. මහා ප්‍රජාපතී ගෝතමියගේ පුතණුවන් වූයේ රාහුල කුමරු ය. ( )

(ලකුණු 10)

**08. පහත සඳහන් ප්‍රකාශ කවුරුන් විසින් කාහට ප්‍රකාශ කරන ලද්දේ දැයි දක්වන්න.**

| ප්‍රකාශය | කවුරුන් විසින් | කාහට |
|---|---|---|
| 1. දරුවෙනි, මේ අමුත්තා ගැන විමසිල්ලෙන් සිටිවූ. | | |
| 2. ඔබටත් පසුව පැවිදිවීමට ඉඩ ලැබෙනු ඇත. | | |
| 3. දූන් අපි දෙදෙනා ම විමුක්තියෙන් සමාන වෙමු. | | |
| 4 මහරජ, මම කිසිසේත් කම්සුව සොයන්නෙක් නොවෙමි. | | |
| 5. දේවයන් වහන්ස, අලුත් කෙනෙක් නුවර පිඬු පිණිස හැසිරෙති. | | |

(ලකුණු 10)

**09. පහත සඳහන් ගාථා වලින් 3 ක් තෝරාගෙන සම්පූර්ණ කර ලියන්න.**

**i.** මල් පූජා කරන ගාථාව ලියන්න.

**ii.** පහන් පූජා කරන ගාථාව ලියන්න.

**iii.** පැන් පූජා කරන ගාථාව ලියන්න.

**iv.** දෑහැත් පූජා කරන ගාථාව ලියන්න.

**v.** ආහාර පූජා කරන ගාථාව ලියන්න.

(ලකුණු 15)